ස්ථාවර නියෝග අංක 119 (4) ප්‍රකාර රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තා සම්බන්ධයෙන් නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම.

நிலையியற் கட்டளை இலக்கம் 119(4) பிரகாரம் அரசாங்க கணக்குகள் பற்றிய குழுவினால் பாராளுமன்றத்துக்கு சமர்ப்பித்த அறிக்கை தொடர்பிலான அவதானிப்புகளையும் மேற்கொண்ட நடவடிக்கைகளையும் சமர்ப்பித்தல்.

Submission of observations and steps taken with regard to the reports presented to the Parliament by the Committee on Public Accounts in terms of theStanding Order No. 119(4)

පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය
பாராளுமன்ற சபைமுதல்வரின் அலுவலகம்
Office of the Leader of the House of Parliament

ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාර රජයේ ගිණුම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තා සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලැබූ ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290
ආයතනයේ නම : පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය

2023 මූල්‍ය වර්ෂය සඳහා වූ මූල්‍ය හා කාර්යසාධන ඇගයුමේදී හඳුනාගත් දුර්වලතා	දුර්වලතා නිවැරදි කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියා මාර්ග/ වර්තමාන තත්වය
1 කොටස	
• සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය සඳහන් කර නොතිබීම	පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ සංචිත හා වෙන්කළ වාහන ඇත්තේ 12 ක් පමණි. එනම් වෙන්කළ වාහන 05 ක් හා සංචිත වාහන 07 ක් වශයෙනි. නිලධාරීන් වෙනුවෙන් වෙන්කළ වාහන කාර්මික දෝෂයන්ට ලක්ව අලුත්වැඩියා කටයුතු සඳහා යොමු කරන විට බොහෝ විට සංචිත වාහන නිලධරයන්ගේ රාජකාරී සඳහා යොදවනු ලබයි. මෙම කාර්යාලයේ භාවිතා කරනු ලබන වාහනවලින් වාහන 02 ක් හැර ඉතිරි වාහන සියල්ලම වසර 15-20 කට වඩා පැරණි වාහන වේ. එමෙන්ම පාර්ලිමේන්තුව අවට බොහෝ අවස්ථාවලදී උද්ඝෝෂණ හා කැරලි කෝලහාල ද පවතින බැවින් සථිරව රාජ්‍ය ලාංඡනය වාහනයට යොදා තිබීමෙන් ඉහත අවස්ථාවල දී ප්‍රකෝපකාරී ජනතාවගෙන් වාහනවලට හානි සිදුවිය හැකි බැවින් රාජ්‍ය ලාංඡනය ස්ථිරව මුද්‍රණය නොකළ අතර සෑම වාහනයක්ම හඳුනාගැනීමට හැකිවන පරිදි රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර වාහනයේ ඉදිරිපස ප්‍රදර්ශනය පිණිස තබා ඇති බවද වැඩි දුරටත් සඳහන් කරමි.
• වර්ෂය ආරම්භයේදී අභ්‍යන්තර විගණන වැඩසටහනක් සකස් කර නොතිබීම හා වර්ෂය තුළ අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පවත්වා නොතිබීම	පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය සඳහා අනුමතව ඇති සීමිත කාර්ය මණ්ඩලය තුළ ගණකාධිකාරී තනතුරක් අනුමතව නොමැති අතර, අභ්‍යන්තර විගණන ඒකකයක්ද ස්ථාපිත කර නොතිබුනි. එකී හේතුවෙන් මු.රෙ. 134(2) අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වැඩි වශයෙන් පැවැත්වීමට නොහැකි විය. කෙසේ වෙතත් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වන වගන්තිය අනුව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවිය යුතු ආයතන යටතට පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය සඳහන් කර නොමැති වුවද, 2023.08.24 දින විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී ගන්නා ලද තීරණයක් අනුව සුදුසු නිලධාරියෙකු අභ්‍යන්තර විගණක ලෙස පත් කළ යුතු බැවින්, සභානායක කාර්යාලයට ස්ථානමාරු වී පැමිණි කළමනාකරණ සේවා නිලධාරියෙකු අභ්‍යන්තර විගණක ලෙස දැනටමත් පත්කර ඇත. එබැවින් ඉදිරියේ දී මු.රෙ. 134(2) අනුව කටයුතු කිරීමට හැකිවනු ඇත.

2 කොටස • හඳුනාගත් තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ මට්ටම මැනිය හැකි කාර්යසාධක ඉලක්ක සකසා නොතිබීම	පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය මගින් පනත් කෙටුම්පත් හා වාර්තා පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන අතර ඒ සම්බන්ධ කටයුතු කිරීමේ සම්පූර්ණ වගකීම ඒ ඒ අමාත්‍යාංශ සතුවේ. එම වාර්තා හා පනත් ක්‍රියාත්මක කිරීමේදී තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට හැකිවේ. කෙසේ වෙතත් එය ක්‍රියාත්මක කිරීමේ දී ඒ සම්බන්ධ අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක අදාළ අමාත්‍යාංශ විසින් සපුරාගනු ලබන හෙයින් ඒ සම්බන්ධ කටයුතු කිරීමට සභානායක කාර්යාලයට හැකියාවක් නොමැත.

හර්ෂ විජේවර්ධන
පාර්ලිමේන්තුවේ සභානායක ලේකම්